ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 29/03/2021 |

පැමිණිලි පාර්ශවය : උස්වත්තගේ දිලේෂ් චතුරංග මහතා,
නො 20/24, ගජබා පාර,
මැතිං ටවුන්, කොළඹ 08.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
ඩී.එස්.සේනානායක විද්‍යාලය,
කොළඹ 07.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/3220/16**

පැමිණිලි පාර්ශවයේ කරුණු සැලකිරීම් -:

උක්ත නම සඳහන් පැමිණිලිකරු 2016-08-24 දාතමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමා ඉහත ලිපිනයේ පදිංචිව සිටින බවත්, 2017 වසරේ පළමු ශ්‍රේණිය සඳහා කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයට තම පුත්‍රයා ඇතුළත් කර ගැනීම සඳහා 17/2016 චක්‍ර ලේඛය පරිදි ඉල්ලුම්පත්‍රයක් යොමු කළ බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණයේදී තමා පදිංචි ස්ථානයේ අයිතිය තහවුරු කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කර ඇති ලේඛනය ඉදිරිපත් කළද පිළිගැනීමට නොහැකි බව ප්‍රකාශ කරමින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පදිංචි ස්ථානය සඳහා තමන් වෙත ලකුණු ලබා දීමක් සිදු නොකළ බවත් සඳහන් කර ඇත. පසුව මේ සම්බන්ධයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත කරුණු ඉදිරිපත් කර කඩිනමින් තමන්ගේ පදිංචි ස්ථානයේ අයිතිය හිමි බවට ඔප්පුවක් හෝ බදු ඔප්පුවක් ලබා දෙන ලෙසට තමා විසින් ඉල්ලා සිටි බවද සඳහන් කර ඇත.

කෙසේ වෙතත් මෙම කටයුතු සිදු කෙරෙන අතරතුර 2017 වසරේ පළමු වසර සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළ ක්‍රියාවලිය ආරම්භ වී එම කටයුතු චක්‍රලේඛය පරිදි සිදුවෙමින් පැවැති බවත්, මේ අතරතුර තමාගේ මව වන විනිතා නන්දනී යන අය නමින් 2016-11-15 වන දින ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් තමන් පදිංචි වී සිටින දේපළෙහි හිමිකම් පවරා දී බදු ඔප්පුවක් ලබා දී

එම ඔප්පුව ඩී.එස්.සේනානායක විද්‍යාලයේ විදුහල්පතිවරයා ඇතුලු පාසල් පරිපාලන වෙත ඉදිරිපත් කර තම පුත්‍රයා ඇතුලත් කර ගන්නා ලෙස ඉල්ලා සිටි නමුත්, එහිදි චක්‍රලේඛය පරිදි අයදුම්පත් භාර ගන්නා දිනය වන විට පදිංචි ස්ථානයේ අයිතිය සම්බන්ධ තහවුරු කිරිම අවශ්‍ය වන බවට දන්වා සිටින ලද බවත් සඳහන් කර ඇත.

ඒ අනුව තමා විසින් ඒ පිළිබඳව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත කරුණු දක්වා පදිංචි ස්ථානය පිහිටි දේපලට අදාල තම මවගේ නමින් බදු ඔප්පුවක් ලබා ගෙන එය පාසල වෙත ඉදිරිපත් කරනු ලැබූ බවත්, එම බදු ඔප්පුව පාසලට දරුවන් ඇතුලත් කර ගැනිම සඳහා අයදුම්පත් කැඳවන දිනයෙන් පසුව ලබාදි ඇති බැවින්, චක්‍ර ලේඛයට අනුව ඒ සඳහා ලකුණු ලබාදිය නොහැකි බවට විදුහල්පතිවරයා ඇතුලු පාසල් පරිපාලනය විසින් තමා වෙත ප්‍රකාශ කල බවත් සඳහන් කර ඇත. ඒ අනුව එම බදු ඔප්පුව පෙරදාතම් කර ලබා ගැනිම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඉදිරිපත් කර තිබූ පැමිණිල්ල සම්බන්ධව වැඩිදුර විමර්ශනය සිදු කරන අතරතුර උත්සහ කල නමුත්, එය මෙතෙක් සාර්ථක වී නොමැති බවද සඳහන් කර ඇත. මෙම තත්ත්වය තුල සියලු සුදුසුකම් සපුරා තිබියදි තම දරුවා කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ 2017 පළමු වසර සඳහා ඇතුලත් කර නොගැනිමට විදුහල්පතිවරයා ඇතුලු සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා මණ්ඩල අවශ්‍ය කටයුතු සලසා නොදිම මගින් තම මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවත්, ඒ පිළිබඳව වැඩිදුර විමර්ශනයක් සිදු කර තම දරුවා ඩී.එස්.සේනානායක විද්‍යාලයට ඇතුලත් කර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු සැලකිරිම –:

මෙම පැමිණිල්ලට අදාලව පරික්ෂණ කටයුතු සඳහා අවස්ථා කිහිපයකදි පාර්ශවකරුවන් කැඳවා ඇති අතර, ඒ අනුව විදුහල්පති ඩී.එස්.සේනානානයක විද්‍යාලය කොළඹ වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2017 වසරේ පළමු වසරට තම පාසල සඳහා දරුවන් ඇතුලත් කිරිමට පැවැති සම්මුඛ පරීක්‍ෂණයේදි මෙම පැමිණිලිකරු විසින් තම පුත්‍රයා ඇතුලත් කර ගැනිමට ආසන්නතා පදනම මත යටතේ ඉදිරිපත් කර තිබූ ලිපි ලේඛන සලකා බැලිමේදි ලබා දිමට හැකිව තිබූ උපරිම ලකුණු සීමාව ලකුණු 35ක් බවත්, අයදුම්කරුගේ පදිංචිය තහවුරු කිරිම සඳහා විධිමත් ලේඛනයක් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවයට ලබාදිය හැකි ලකුණු ප්‍රමාණයන් චක්‍ර ලේඛයට අනුව ලබා දිමට හැකියාවක් නොමැති බවත් සඳහන් කර ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කරුණු දැක්විම –:

මෙම පැමිණිල්ලට අදාල වැඩිදුර විමර්ශනයේදි තෙවන පාර්ශවයක් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පාර්ශවකරුවකු ලෙස කැඳවා විමසිම් සිදු කර ඇති අතර, එහිදි එම නිලධාරින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරුගේ දරුවා 2017 වසරේ කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයට ඇතුලත් කර ගැනිම සඳහා පදිංචි ස්ථානයේ හිමිකම සම්බන්ධව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් පාසල වෙත ලබා දිම සඳහා ලිපි ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර, ඒ අනුව අවස්ථා කිහිපයකදි තමන් විසින් ඔවුන්ගේ ඉල්ලිමට ප්‍රතිචාර දක්වා ඇති බවයි. ඒ අනුව අදාල ලිපි දරුවා පාසලට

ඇතුලත් කර ගැනීමට ප්‍රමාණවත් නොවන බවට ඔවුන් විසින් නැවත වතාවක් දන්වා ඇති බැවින්, කරුණු සලකා බලා යූ.ඩී. චතුරංග නැමැති මෙම පැමිණිලිකරුගේ මවගේ නමට අදාළ දේපල සඳහා බදු ඔප්පුවක් ලබා දීමට කටයුතු කර ඇති බවද සඳහන් කර ඇත. තවද එම බදු ඔප්පුව අත්සන් කර ඇත්තේ 2016 නොවැම්බර් මස 15 වන දින බැවින් ඩී.එස්. සේනානායක විදුහලේ විදුහල්පතිවරයා ඇතුලු පරිපාලනය එය දරුවා ඇතුලත් කර ගැනීමට අදාළ කර ගත නොහැකි බව ප්‍රකාශ කළ බව පැමිණිලිකරු තමන් වෙත ප්‍රකාශ කර ඇති බව පවසන අතර, එම බදු ඔප්පුව පෙරදාතම කර ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇති බවද දක්වා ඇත. කෙසේ වෙතත් පැමිණිලිකරුගේ ඉල්ලීම ඉටු කළ නොහැකි බවට දන්වා ඇති අතර, මෙම දේපල සඳහා සින්නක්කර ඔප්පු ලබා දීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගැනීමට කටයුතු කරන බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය -:**

මෙම පැමිණිල්ලට අදාළ වැඩිදුර විමර්ශන සඳහා අවස්ථා කිහිපයකදී අදාළ පාර්ශවකරුවන් කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, වැඩිදුර විමර්ශනයේදී පළමු වගඋත්තරකරු වන විදුහල්පති, කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලය විසින් ඉහතින් සඳහන් කර ඇති පරිදි පැමිණිලිකරුගේ පුත්‍රයා 2017 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර නොගැනීමට බලපෑ ප්‍රධානතම හේතුව ලෙස දක්වන පදිංචි ස්ථානයේ අයිතිය තහවුරු කිරීමට හැකියාවක් නොවීම යන්න ගෙනහැර දක්වා ඇත. තවද පළමු සම්මුඛ පරීක්ෂණයේදී සහ ඉන් පසුව පැවැති අභියාචනා විරෝධතා මණ්ඩල හමුවට පැමිණිලිකරු ඉදිරිපත් වූ අවස්ථා වලදී වගඋත්තරකරු පැමිණිලිකරු වෙත උපදෙස් ලබා දී ඇත්තේ පදිංචි ස්ථානයේ අයිතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් තහවුරු කෙරෙන ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසට බව දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු විසින් අවස්ථා කිහිපයකදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අදාළ බලධාරීන් වෙත ඒ පිළිබඳව ලිඛිත ඉල්ලීම් සිදුකර එහි ප්‍රතිඵලයක් ලෙස පැමිණිලිකරුගේ මවගේ නමින් බදු ඔප්පුවක් ලබා දී ඇත. අදාළ බදු ඔප්පුවේ සඳහන් දින වකවානු වල ගැටළුවක් හේතුවෙන් එය පෙරදාතම් කර (Back date) ලබාදෙන ලෙස එනම් චක්‍ර ලේඛයෙහි සඳහන් පරිදි අයදුම් පත්‍රය භාර ගන්නා දිනයට පෙර දිනයක් සඳහන් කර ලබා දෙන ලෙස ඉල්ලා ඇතත්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒ අනුව කටයුතු කර නොමැත.

මෙම තත්ත්වය තුළ මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණ අවස්ථාවන්හිදී ඉහත තත්ත්වය අනුව මෙම පැමිණිල්ල සමථයකට එළඹීමට වගඋත්තරකාර පාර්ශවය වෙත යෝජනා කර ඇතත් ඊට එකඟත්වය පළ කර නැත. කෙසේ වෙතත් මානව හිමිකම් කොමිෂන් සභාවේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිර්දේශ කරන්නේ නම් පැමිණිලිකරුගේ පුත්‍රයා තම පාසලේ පළමු වසරට ඇතුලත් කර ගැනීමට හැකියාව ඇති බව ඩී.එස්. සේනානායක විදුහල පරිපාලනය පරීක්ෂණ අවස්ථා වලදී ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ හා නිගමන -:**

මෙම පැමිණිල්ලට අදාලව පාර්ශවයන් විසින් ලබා දී ඇති ලිඛිත හා වාචික සැලකිරීම් සැලකිල්ලට ගැනීමේදී මෙම පැමිණිලිකරු පදංචිව සිටින ස්ථානය ඔහුගේ පියාට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලබා දී ඇති බවත්. එය 2000 වසරේ ලබා දී ඇති බවත්. පියා මිය යෑමෙන් පසුව පැමිණිලිකරු සහ ඔහුගේ මව එහි පදිංචිව සිට ඇති බවත්. ඉන්පසුව ඔහු විවාහ වීමෙන් පසුව භාර්යාව සහ පුත්‍රයා ඇතුලු පවුලේ සියළුදෙනා මෙම නිවසේ පදිංචි වී සිට ඇති බවට අනාවරණය වේ.

තවද මෙම දේපලෙහි අයිතිය සම්බන්ධ පිළිගත හැකි ඔප්පුවක් ලබා දෙන ලෙස පැමිණිලිකරුගේ මව විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් අවස්ථා කිහිපයකදී ඉල්ලීම් සිදු කර ඇති අතර. එම ඉල්ලීම අනුව නිවාස සංවර්ධන අධිකාරිය මගින් බදු ඔප්පුවක් පැමිණිලිකරුගේ මව නමින් ලබා දී ඇතත්. එය පැමිණිලිකරුගේ පදිංචි ස්ථානයේ අයිතිය තහවුරු කිරීම පිණිස 17/2016 චක්‍ර ලේඛය පරිදි අයදුම්පත් භාර ගන්නා දිනයට පසුව ලබාදී ඇති එකක් බැවින්. එය පිළිගත නොහැකි බව ඩී.එස්. සේනානායක විද්‍යාලය විසින් ප්‍රකාශ කිරීම සාධාරණ නොවන බව නිරීක්ෂණය වේ. ඊට හේතුව වන්නේ පැමිණිලිකරු නැතහොත් දරුවාගේ පියා ඩී.එස්. සේනානායක විද්‍යාලයට තම දරුවා ඇතුලත් කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති අනෙකුත් අවශ්‍ය ලේඛන එනම්. ජල බිල්පත්. ග්‍රාම සේවක සහතික. විදුලි බිල්පත්. වරිපනම්. දුරකථන බිල්. ඡන්ද හිමි නාම ලේඛනය. දරුවාගේ බැංකු පොත් මගින් තමා එම ස්ථානයේ දිර්ඝ කාලීනව පදිංචිව සිටින බවට සනාථ කොට තහවුරු කර ඇති හෙයිනි. එම නිසා එම කරුණු නොසලකා හැර වගඋත්තරකරුවන් කටයුතු කිරීම යුක්ති සහගත නොවන බව පෙන්වා දිය හැකි අතර. 17/2016 චක්‍රලේඛයේ ප්‍රතිපාදන මගින් මෙම පැමිණිලිකරු වැනි ඉල්ලුම්කරුවන් සඳහා තම පදිංචිය තහවුරු කිරීම පිණිස අවශ්‍ය ප්‍රමාණයට අදාළ ලේඛන ඉදිරිපත් කර තිබියදී ආසන්නතාවය යටතේ ඉදිරිපත් කරන අයදුම්පත්‍රයක් සඳහා සම්පූර්ණ ලකුණු ලබා නොදීමට වගඋත්තරකරු වන විදුහල්පති කොළඹ ඩී.එස්. සේනානායක විදුහල සහ අභියාචනා විරෝධතා මණ්ඩල සභාපති ඇතුලු සාමාජිකයින් හට ඉඩකඩක් සලසා දී නොමැති බවද නිරික්ෂණය වේ. එසේම පැමිණිලිකරු තම දරුවා ඇතුලත් කර ගැනීමට ඉදිරිපත් කර ඇති අනෙකුත් සියළුම ලේඛන. අසත්‍ය ලේඛන බවට වැඩිදුර විමර්ශනයේදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කර නොමැත.

ඉහත තත්ත්වය තුළ පැමිණිලිකරුගේ දරුවා 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර නොගැනීම මගින් වගඋත්තරකරු වන විදුහල්පති ඩී.එස්. සේනානායක විද්‍යාලය. කොළඹ විසින් පැමිණිලිකරු වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව තුළින් තහවුරු කරදී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන උස්වත්තගේ රිසත් දුල්නිත දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2017 වර්ෂයේ 1 වන ශ්‍රේණියට ඇතුලත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට කරුණු අනාවරණය වී ඇත. කෙසේ වෙතත් මෙම පැමිණිල්ලට අදාල අවසාන නිර්දේශය නිකුත් කිරීමට සිදුව ඇත්තේ 2021 වසරේදී වන බැවින් එම දරුවා 2021 වසරේදී ඇතුලත් විය යුතු සමාන්තර ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට කටයුතු කල යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.05.03 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H.**
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. ගරු අමාත්‍යතුමා.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

02. ජාතික පාසැල් අධ්‍යක්ෂ. - අවශ්‍ය පියවර ගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/